# ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය

# ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

## 01 පරිච්ඡේදය

### හැඳින්වීම

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය 1996 වර්ෂයේ දී ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ලෙස සමාජ සේවා සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදි. සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සැලසුම් කරනු පිණිස හා ක්‍රියාත්මක කරනු පිණිස එය 2005.12.08 දින අංක 1422/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආපදා සහන සේවා අමාත්‍යාංශය බවට පත් විය. 2007.01.09 දින අංක 1482/9 දරන ගැසට් නිවේදනය මගින් එය ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය ලෙස නම් කොට නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යාංශය වෙත පවරන ලදී. අංක 1651/220 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව 2010.04.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. 2020.08.09 දිනැති අංක 2187/27 දරණ ගැසට් නිවේදනය අනුව අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අතර 2020-11-20 දිනැති අංක 2202/25 දරණ අති විශේෂ ගැසට් නිවේදනය අනුව රාජ්‍ය ආරක්ෂක, හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය කොළඹ 07, විද්‍යා මාවතේ පිහිටා ඇති අතර ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා සහ ලේකම් විසින් දෙනු ලබන උපදෙස් සහ මාර්ගෝපදේශකත්වය යටතේ ආපදා සහන සේවා විෂයපථයට අදාල වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ. එම ව්‍යාපෘති හා වැඩසටහන් මගින් සහන සේවා සැපයීමේ කටයුතු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ ආපදා සහනසේවා නිලධාරින් (සංවර්ධන නිලධාරී) සිදු කරනු ලබයි.

### දැක්ම

ප්‍රශස්ත පසු ආපදා සහන සේවාවන් තුළින් වඩාත් සුරක්ෂිත ශ්‍රී ලංකාවක්

මෙහෙවර

ස්වභාවික හා මිනිසා විසින් ඇති කරනු ලබන ආපදාවන්ගෙන් සිදුවන අනර්ථකාරී බලපෑම්වලට ප්‍රතිචාර දැක්වීම හා යථාවත් කිරීම මගින් මිනිස් ජීවිත, දේපළ හා ජන ජීවිතය සුරැකීම

### අරමුණ

සමාජයට පරිසරයට හා ආර්ථිකයට ආපදා වලින් ඇති කරන අහිතකර බලපෑම් අවම කිරීම සහ ආපදා සහන සඳහා ජාතික හා ප්‍රාදේශීය ධාරිතාවන් ශක්තිමත් කිරීම තුළින් තිරසාර සංවර්ධනය කිරීමේ ජාතික අරමුණට දායක වීම.

එම අරමුණ වාඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය ආපදා සහන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම සිදුකරයි. එම කටයුතු 2020-04-01 දින සිට ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2020 හා වරින් වර නිකුත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල අනුමැතීන්, චක්‍ර ලේඛ උපදෙස් අනුව ක්‍රියාත්මක කරනු ලැබේ.

එම චක්‍රලේඛ හා උපදෙස් අනුව ප්‍රමුඛතා ක්ෂේත්‍ර හතරක් යටතේ ස්වාභාවික ආපදාවන් හේතුවෙන් පීඩාවට පත්වන ජනතාව වෙත සහන සේවා සැපයීම සිදුකරනු ලබයි. මීට අමතරව ආපදා සහන සේවා කටයුතු සැලසීමේ යාන්ත්‍රනයෙහි කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ තාක්ෂණික හා මූල්‍ය දායකත්වයෙන් ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් පුහුණු, දැනුවත් කිරීම් හා ධාරිතා සංවරධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

## 1.2. සංවිධාන සටහන



අධ්‍යක්ෂ (01)
(ශ්‍රී.ලං.ප.සේ. I) SL-1
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ පාලන (02)
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ සංවර්ධන (02)
(ශ්‍රී.ලං.ප.සේ. II / III) SL-1
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (01)
(ශ්‍රී.ලං.ක්‍රි.සේ. II / III) SL-1
ගණකාධිකාරී (01)
(ශ්‍රී.ලං.ගණ.සේ. II / III) SL-1
පරිපාලන නිලධාරී (01)
(රා.කළ.සේ. අධි පන්තිය) MN-7
සංවර්ධන නිලධාරී දිස්ත්‍රික් (25) (ස.නි.සේවය) MN-4
සංවර්ධන නිලධාරී ප්‍රා.ලේ (332) (ස.නි.සේවය) MN-4
ව්‍යාපෘති නිලධාරී (01) (ආශ්‍රිත සේවා) MN-4
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී (02)
(තො.ස.තා සේවය II) MN-6
සංවර්ධන නිලධාරී ප්‍රා.ලේ (07)
(ස.නි.සේවය) MN-4
කළමනාකරණ සේවා නිලධාරී (06)
(ක.සේ.නි.සේ I/II/III) MN-2
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර (01)
(තො.ස.තා සේවය III) MN-1
කළමනාකරණ සේවා නිලධාරී (02)
(ක.සේ.නි.සේ I/II/III) MN-2
රියදුරු (07)
(රියදුරු සේවය) PL-3
කාර්යාල කාර්ය සහායක (04)
(කා.සේ.සේ. I/II/III)
PL-1
ලොරි රථ සහායක (05)
(දෙපාර්තමේන්තුගත) PL-1

## 02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

**භාණ්ඩාගාර ප්‍රතිපාදන හා වියදම**

| අනු අංකය | වැය විස්තර | ප්‍රතිපාදන ප්‍රමාණය රු. | වියදම රු. |
|---|---|---|---|
| 01 | පුනරාවර්තන | 781,890,000.00 | 642,693,994.50 |
| 02 | ප්‍රාග්ධන | 1,594,500,000.00 | 1,070,101,062.05 |
| එකතුව | | 2,376,390,000.00 | 1,712,795,056.55 |

### 2.1 කාර්යක්ෂම ආපදා සහන සේවාවක් තුලින් විපතට පත්වූවන් සඳහා කඩිනමින් සහන ලබාදීම.

ආපදාවක් සිදුවී අවම කාලයක් තුල ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි. ආපදා හේතුවෙන් විපතට පත් ජනතාව සුරක්ෂිත මධ්‍යස්ථාන හා ආරක්ෂිත ස්ථානවටල යොමු කරනු ලබන අතර ඔවුන් නැවත තම පදිංචි ස්ථාන වෙත යොමු කරන තෙක් පිසූ ආහාර ලබාදීම, ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම, මරණ, හා අබාධිත පුද්ගලයන් වෙත වන්දි ලබා දීම මෙන්ම තම දෛනික ජන ජීවිතය යථා තත්ත්වයට පත්වන තෙක් වියළි සලාක සැපයීම සිදු කරනු ලබයි. 2019 වර්ෂයේ ආරම්භ වූ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් විපතට පත් ජනතාව වෙත සහන සැලසීමේ කටයුතු සිදු කරනු ලබයි. ඒ සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දේ. එමෙන්ම කොවිඩ් 19 හේතුවෙන් සිදුවන මරණ ඥාතීන් විසින් භාර නොගන්නා අවස්ථාවලදී එම මරණ වල අවසන් කටයුතු සඳහා වැයවන පිරිවැය දැරීම සිදුකරනු ලබයි.

2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දිවයිනට බලපාන ලද ස්වභාවික ආපදා හේතුවෙන් පවුල් 247562 ක පුද්ගලයින් 930381 පීඩාවට පත්ව ඇත. එම ජනතාව අතුරින් පවුල් 16787 ක පුද්ගලයින් 66230 සුරක්ෂිත මධ්‍යස්ථාන 420ක රඳවා තිබූ අතර පුද්ගල මරණ 132 ක් වාර්තා වී ඇත.

**එම විපතට පත් පිරිස් වෙත මූලික පහසුකම් සැලසීමේ ප්‍රගතිය**

| විස්තරය | ඒකකය | ප්‍රමාණය | වියදම රු. |
|---|---|---|---|
| පිසූ ආහාර | පුද්ගල | 546,302 | 156,114,117.64 |
| වියළි සළාක | පවුල් | 40,106 | 18,627,405.00 |
| මරණ | සංඛ්‍යාව | 112 | 5,525,000.00 |
| ඉන්ධන | | | 582,435 |
| පරිපාලන | | | 3,223,575.22 |
| වෙනත් / හදිසි ප්‍රතිචාර (1,000,000) | | | 96,247,699.51 |
| එකතුව | | | 280,320,232.37 |

### 2.2 ආපදා හේතුවෙන් හානියට පත්වූ නිවාස, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි ප්‍රතිපූර්ණය කිරීම

ස්වාභාවික ආපදාවන්ගෙන් නිවාස, ගෘහ උපකරණ සහ වෙනත් රක්ෂණාවරණයකින් ප්‍රතිලාභ නොලබන වාර්ෂික ආදායම රු.මි. 10 නොඉක්මවන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගොඩනැගිලි, උපකරණ හා තොග වලට සිදුවන හානි සඳහා තක්සේරු කමිටුවක් මගින් සිදුකරනු ලබන හානි තක්සේරු ඇස්තමේන්තුව පදනම් කරගනිමින් රුපියල් මිලියන 2.5 ක උපරිමයකට යටත්ව වන්දි ලබා දීම සිදු කරනු ලබයි.

ස්වභාවික ආපදා හේතුවෙන් හානියට පත් නිවාස වෙනුවෙන් වන්දි මුදල් ලබාදීම සඳහා හානි තක්සේරු කටයුතු සිදු කර අයදුම්පත් ඉදිරිපත් කරන තෙක් එම නිවාස කඩිනමින් පිළිසකර කරගැනීම සඳහා හානියට පත්වූවන් වෙත රුපියල් 10,000/- ක අත්තිකාරම් මුදලක් ද ලබා දීම සිදු කරනු ලැබේ. සම්පූර්ණ කරණ ලද අයදුම්පත් තක්සේරු කමිටුව මගින් තහවුරු කිරීමෙන් පසු ඉතිරි වන්දිමුදල් ලබා දීම සිදු කරනු ලැබේ.

2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දිවයිනට බලපාන ලද ස්වභාවික ආපදා හේතුවෙන් පූර්ණ නිවාස හානි 360 හා අර්ධ නිවාස හානි 26146 ක් හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි 1494 ක් වාර්තා වී ඇත. ඒම නිවාස හා දේපළ හානි වන්දි මෙන්ම 2020 වර්ෂයේ වන්දි ලබා නොදුන් ප්‍රතිලාභීන් වෙත පහත පරිදි වන්දි ලබා දී ඇත.

| රු. 10,000 දක්වා අත්තිකාරම් ලබා දීම | | | | රු. 25,000 දක්වා දේපළ හානි | | රු. 25,000 ට වැඩි දේපළ හානි | | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|
| පූර්ණ හානි සංඛ්‍යාව | අර්ධ හානි සංඛ්‍යාව | එකතුව | ප්‍රතිපාදන ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය | |
| 360 | 26,041 | 26,401 | 233,439,575.86 | 4,683 | 46,846,069.70 | 1,812 | 97,074,664.20 | 377,360,309.76 |

## 2.3 ආපදා හා ආපදා අවදානම හේතුවෙන් ඉවත් කරනු ලබන පවුල් නැවත පදිංචි කිරීම

කෑගල්ල දිස්ත්‍රික්කයේ 2016 වර්ෂයේ හා 2017 වර්ෂයේ තවත් දිස්ත්‍රික්ක කිහිපයක සිදුවූ නායයෑමේ ආපදා තත්ත්වයන් හේතුවෙන් නිවාස හානි වූ හා නායයෑමේ අධි අවදානම හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කළයුතු ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගන්නා ලද පවුල් නැවත පදිංචි කිරීමේ වැඩසටහන දිස්ත්‍රික්ක 14ක ක්‍රියාත්මක වේ.

මේවන විට හඳුනා ගෙන ඇති හා ඉදිරියේදී හඳුනා ගන්නා ප්‍රතිලාභී පවුල් 15,025ක් ආරක්ෂිත ස්ථානයන්හි නැවත පදිංචි කිරීම සඳහා ලබා ගන්නා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියන් අනුව බදුල්ල, නුවරඑළිය, මහනුවර, මාතලේ, කෑගල්ල, කළුතර, මාතර, රත්නපුර, හම්බන්තොට, ගාල්ල, කොළඹ, ගම්පහ, කුරුණෑගල හා මොනරාගල යන දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 121ක දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතී.

ඒ අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කළයුතු ලෙස මේ දක්වා හඳුනා ගන්නා ලද ප්‍රතිලාභී පවුල් 13846 ක් නැවත පදිංචි කිරීම, එම ආයතනයේ තාක්ෂණික දායකත්වය හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිපාදන සැපයීම හා සම්බන්ධීකරණය යටතේ සිදු කෙරේ.

අමාත්‍ය මණ්ඩල අනුමැතියන් අනුව පහත විකල්ප අවස්ථා 03 යටතේ ප්‍රතිලාභී පවුල් නැවත පදිංචි කිරීම් සිදු කරනු ලබයි

- ඉඩමක් සමග නිවසක් මිලදී ගැනීමට රු. මි .1.6 ක් ලබා දීම
- ඉඩමක් මිලදී ගැනීම සඳහා රු. මි . 0.4 ක් සහ එහි නිවස ඉදිකිරීම සඳහා රු. මි . 1.2 ක් ලබා දීම
- රජයේ ඉඩම් ලබාදී එම ඉඩමෙහි නිවස ඉදිකිරීම සඳහා රු. මි . 1.2 ක් ලබා දීම

2017 වර්ෂයේ ආරම්භ කරන ලද නැවත පදිංචි කිරීමේ වැඩසටහනේ ප්‍රගතිය පහත වගුවෙන් දැක්වෙන අතර ඒ සඳහා වැයකර ඇති මුළු මුදල රු.මි 4462.82කි.

| නැවත පදිංචි කළ යුතු පවුල් සංඛ්‍යාව | ඉඩම් කට්ටි ලබා දී ඇති හා නිවාස ඉදිකිරීම සඳහා ඉඩමක් සතු පවුල් සංඛ්‍යාව | ඉදිකරමින් පවතින නිවාස ගණන | ඉදිකර අවසන් නිවාස ගණන |
|---|---|---|---|
| 13846 | 4652 | 2053 | 1726 |

කෑගල්ල දිස්ත්‍රික්කයේ 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද නැවත පදිංචි කිරීමේ වැඩසටහනෙහි 2021-12-31 දිනට ප්‍රගතිය 97% කි එම තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

| ආරම්භක වර්ෂය | ප්‍රතිලාභී සංඛ්‍යාව | ක්‍රියාත්මක දිස්ත්‍රික්කය | පදිංචි කර ඇති සංඛ්‍යාව | ඉදිකරමින් පවතින නිවාස සංඛ්‍යාව | වියදම රු.මි | වෙනත් |
|---|---|---|---|---|---|---|
| 2016 | 1688 | කෑගල්ල | 1578 | 108 | 2,005.32 | නිවාස 2ක් මිලදී ගැනීමට ඇත |

## 2.4 වියළි කාලගුණය හේතුවෙන් සිදුවන හානිය අවම කිරීම සඳහා මූල්‍ය හා භෞතික පහසුකම් සැපයීම

දිවයිනට බලපානු ලබන වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් තම දෛනික පානීය ජල අවශ්‍යතාව සපුරා ගත නොහැකිව බොහෝ පිරිසක් පීඩාවට පත්වේ. 2017 දී පවුල් 1,113,858, 2018 දී පවුල් 567,987, 2019 දී පවුල් 312,383 හා 2020 දී පවුල් 310424 පීඩාවට පත්ව ඇත. 2021 වර්ෂයේ පීඩාවට පත්වූ පවුල් 134992 ජනතාව වෙනුවෙන් පානීය ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා දිවයිනේ සියලුම දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ වෙත ට්‍රැක්ටර් බවුසර් 364 ක් ලොරි බවුසර්

133 හා ජල ටැංකි 11936 ක් ලබා දී ඇති අතර 2021 වර්ෂයේ පානීය ජලය ලබාදීමේ පිරිවැය වෙනුවෙන් රු.මි. 40.59 ක ප්‍රතිපාදන අදාල දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත ලබා දී ඇත.

### 2.5 සුරක්ෂිත මධ්‍යස්ථානවල පහසුකම් වැඩිදියුණු කිරීම

ආපදාවන්ට නිරන්තරයෙන් ගොදුරුවන ප්‍රාදේශීයලේකම් කොට්ඨශයන්හි විපතට පත්විය හැකි ජනතාව වඩාත් සුරක්ෂිතව රඳවා තැබීමට හා ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරාලිය හැකි පරිසරයක් නිර්මාණය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් තෝරාගත් සුරක්ෂිත මධ්‍යස්ථාන 325 සනීපාරක්ෂක හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම 2018 වර්ෂයේ ආරම්භ කරන ලදි. එහි ප්‍රගතිය පහත පරිදි වේ.

| වර්ෂය | දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව | අලුත්වැඩියා කරන ලද මධ්‍යස්ථාන සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි | වියදම රු.මි |
|---|---|---|---|---|---|
| 2018 | 20 | 106 | 164 | 102 | 92.51 |
| 2019 | 24 | 189 | 96 | 100 | 78.26 |
| 2020 | 14 | 34 | 38 | 58.40 | 56.08 |
| එකතුව | | | 298 | 260.40 | 226.85 |

2021 වර්ෂයේ එහි දෙවන අදියර ලෙස තවත් සුරක්ෂිත මධ්‍යස්ථාන 300 අලුත්වැඩියා කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව 2021 වර්ෂයේ සුරක්ෂිත මධ්‍යස්ථාන අලුත්වැඩියා කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

| වර්ෂය | දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව | අලුත්වැඩියා කරන ලද මධ්‍යස්ථාන සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි | වියදම රු.මි |
|---|---|---|---|---|---|
| 2021 | 23 | 54 | 48 | 75 | 53.01 |

### 2.6 ආපදා සහන සේවා තොරතුරු පද්ධතීන් ශක්තිමත් කිරීම

2.6.1 ආපදා සහන සේවා කටයුතු පහසු කර ගැනීම සඳහා 2013 වර්ෂයේ නිර්මාණය කරන ලද ආපදා සහන සේවා සැලසීමේ සැලැස්ම වර්ෂ 2017 දී ලෝක ආහාර සංවිධානයේ (WFP) තාක්ෂණික සහාය ඇතිව සහන සේවා සැලසීමේ යාන්ත්‍රනය වඩාත් කාර්යක්ෂම හා ඵලදායිව සිදු කිරීම සඳහා ආපදා සහන සේවා පෙර සූදානම් වීමේ හා ප්‍රතිචාර දැක්වීමේ සැලැස්ම ( අවිනිශ්චිතතා සැලැස්ම) ලෙසින් වැඩිදියුණු කොට එය මාර්ගගත දත්ත පද්ධතියක් ( On Line System) දක්වා වර්ධනය කරන ලදී. හදිසි අවස්ථාවකදී ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය පහත සඳහන් තොරතුරු එම දත්ත පද්ධතිය මගින් ලබා ගත හැකි පරිදි නිර්මාණය කොට ඇත.

- හදිසි ආපදා අවස්ථාවකදී සහන සේවා කටයුතු සඳහා සෘජුව සම්බන්ධවන නිළධාරීන්ගේ සන්නිවේදන තොරතුරු
- ග්‍රාමනිලධාරී කොට්ඨාසයන්හි සන්නිවේදන තොරතුරු
- ගංවතුර ආපදාවට ලක්විය හැකි ග්‍රාම නිලධාරී කොට්ඨාස අනුව සිතියම
- හඳුනාගත් ග්‍රාම නිලධාරී කොට්ඨාස වල බලපෑමට ලක් විය හැකි පවුල් සංඛ්‍යාව
- බලපෑමට ලක්විය හැකි පවුල් රඳවිය හැකි සුරක්ෂිත මධ්‍යස්ථාන තොරතුරු
- සුරක්ෂිත මධ්‍යස්ථාන මෙහෙයුම් කමිටු පිලිබඳ තොරතුරු
- ඉදිරියට සංවර්ධනය කළයුතු හඳුනා ගත් සුරක්ෂිත මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු
- සුරක්ෂිත මධ්‍යස්ථාන සේවා සපයන්නන් ගේ තොරතුරු
- ආපදා සහන සේවා කමිටු පිළිබඳ තොරතුරු
- හදිසි අවස්ථාවකදී අවශ්‍ය වෙතැයි හඳුනා ගෙන ඇති ආහාර ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු

මෙම තොරතුරු http://www.ndrsc.lk/ වෙබ් අඩවිය හරහා ඕනෑම පරිශීලකයකුට ලබා ගත හැකි වන පරිදි ඇතුලත් කොට ඇත.

වර්තමාන අවිනිශ්විතතා සැලස්ම වාර්ෂිකව යාවත්කාලීන කිරීම තුළින් ප්‍රාදේශිය මට්ටමේ රජයේ නිලධාරීන් හා සහන සේවා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ  සැලසුම් වඩාත් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබී ඇත.




2.6.2   ආපදා හේතුවෙන් හානියට පත්වන නිවාස සඳහා කාර්යක්ෂමව හා වඩාත් ඵලදායී ලෙස ප්‍රතිලාභියා වෙත අත්තිකාරම් ගෙවීමේ අරමුණින් 2018 වර්ෂයේ සිට නිවාස හානි වන්දි ලබාදීමේ දී ඉදිරිපත කරනු ලබන අයදුම් පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඇතුළත් කිරීම සඳහා මාර්ගගත දත්ත පද්ධතියක් ( On Line System) නිර්මාණය කොට ඇත. http://housing.ndrsc.lk/authentication මේ වනවිට එහි ඇතුළත් කොට ඇති අයදුම්පත් සංඛ්‍යාව පහත දක්වා ඇත.

| වර්ෂය | අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| 2019 | 20039 |
| 2020 | 11613 |
| 2021 | 8654 |
| එකතුව | 40306 |

**විශේෂ, ජයග්‍රහන, අභියෝග හා ඉදිරි ඉලක්ක**

- 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි (TEC) | පරිපූරක ඇස්තමේන්තුව අනුව වෙන් කිරීමට අපේක්ෂිත පිරිවැය රු.මි |
|---|---|---|
| නායයෑම් අධි අවධානම් සහ නායයෑම් හේතුවෙන් විපතට පත්වන ජනතාව නැවත පදිංචි කිරීම | 21,050 | 500 |
| ආපදා හේතුවෙන් විපතට පත්වන ජනතාව රඳවා තබන සුරක්ෂිත මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම | 300 | 50 |

## 03. ඉදිරි සැලසුම්

1. ඉදිරියේ දි ඇතිවිය හැකි ආපදා තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආපදා සහන සේවා සඳහා වූ පෙර සුදානම් වීම සඳහා සැලසුම් කිරීම වෙනුවෙන් “ආපදා සහන සේවා පෙර සූදානම් වීම සහ ප්‍රතිචාර දැක්වීම පිළිබඳ සැලැස්ම” ක්‍රියාත්මක කිරීම.
2. නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය වඩාත් කාර්යක්ෂම කොට කඩිනමින් අධි අවදානම් ප්‍රදේශ වල සිටින ජනතාව නැවත පදිංචි කරීම.
3. සුරක්ෂිත මධ්‍යස්ථාන ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීම
4. වඩාත් කාර්යක්ෂමව නිවැරදිව තොරතුරු ලබා ගැනීම සඳහා අන්තර්ජාල දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා වැඩි දියුණු කිරීම
5. නිවාස හානි වන්දි ගෙවීම වඩාත් කාර්යක්ෂම කිරීම
6. සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කරණු වලට අනුකූලව යමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථනයේ නිලධාරීන් එකාබද්ධ ප්‍රවේශයෙන් කටයුතු කිරීම

## පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

**ජාතික ඉලක්කය**

ප්‍රශස්ත පසු ආපදා සහන සේවාවන් තුළින් වඩාත් ආරක්ෂිත ශ්‍රී ලංකාවක්.

සමාජයට, පරිසරයට හා ආර්ථිකයට ආපදා වලින් ඇති කරන අහිතකර බලපෑම් අවම කිරීම සහ ආපදා සහන සඳහා ජාතික ධාරිතාවන් ශක්තිමත් කිරීම තුළින් තිරසාර සංවර්ධනය කිරීමේ ජාතික අරමුණට දායක වීම.

වර්ෂ 2020 වන විට ස්වභාවික හා මිනිසා විසින් ඇති කරනු ලබන ආපදාවන්ගෙන් සිදුවන අනර්ථකාරී බලපෑම්වලට ප්‍රතිචාර දැක්වීම හා යථාවත් කිරීම මගින් මිනිස් ජීවිත හා දේපළ සුරැකීම සඳහා වූ ඉලක්කයන්.

## 1. පසු ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම

1.1. කාර්යක්ෂම ආපදා සහන සේවාවක් තුලින් සුදුසු ප්‍රතිලාභියා වෙත ආපදා සහන ලබාදීම.
1.2. ආපදා හේතුවෙන් හානියට ලක්වූ නිවාස සඳහා වන්දි ලබා දීම.
1.3. පසු ආපදා කළමානාකරණ ක්‍රියාවලීන් පිළිබඳව ආපදා සහන සේවා නිලධාරීන් දැනුවත් කිරීම
1.4. සුරක්ෂිත මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම
1.5. නාය යාම් හා නාය අධි අවධානම හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කරනු ලබන පවුල් නැවත පදිංචි කිරීම

| අභිමතාර්ථ | දර්ශක | ඉලක්කය (2021) | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 100%-90% | 75%-89% | 50%-74% |
| කාර්යක්ෂම ආපදා සනසේවා | ආපදාව සිදුවී අවම කාලයක් තුළ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම | පැය තුළ 1 | | ✓ | |
| | සහන කටයුතු සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම | පැය 12 තුළ | | ✓ | |
| | ප්‍රතිපාදන ලබාදීම | රු150 මි. | | | ✓ |
| ආපදා හේතුවෙන් හානියට ලක්වූ නිවාස සඳහා වන්දි ලබා දීම | වන්දි ලබා දුන් නිවාස සංඛ්‍යාව | 26401 | | ✓ | |
| විපතට පත්විය හැකි ජනතාව වඩාත් සුරක්ෂිතව රඳවා තැබීම හා ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරාලීම | සුරක්ෂිත මධ්‍යස්ථාන සංඛ්‍යාව | 60 | ✓ | | |
| නාය යාම් හා නාය අධි අවධානම හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කරනු ලබන පවුල් නැවත පදිංචි කිරීම | ඉදිකොට අවසන් නිවාස සංඛ්‍යාව | 250 | | | ✓ |

## පරිච්ඡේදය 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

| ඉලක්කය / අරමුණ | දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|
| | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 1. සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | ආපදාව සිදුවී පැයක කාලයක් තුළ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම | | | ✓ |
| | ආපදාවක් සිදුවී පැය 12 ක කාලයක් තුළ සහන කටයුතු සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම | | | ✓ |
| | වසරකට ආපදා සඳහා වැයවන ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි 150 දක්වා අවම කිරීම | ✓ | | |
| 11. නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | ආපදා හේතුවෙන් හානියට ලක්වූ නිවාස සඳහා වන්දි ලබා දුන් නිවාස සංඛ්‍යාව | | | ✓ |
| 13. දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම. | විපතට පත්විය හැකි ජනතාව වඩාත් සුරක්ෂිතව රඳවා තැබීම හා ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා වැඩිදියුණු කරණ ලද සුරක්ෂිත මධ්‍යස්ථාන සංඛ්‍යාව | | | ✓ |
| | නාය යාම් හා නාය අධි අවධානම හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කරනු ලබන පවුල් නැවත පදිංචි කිරීම සඳහ ඉදි කරන ලද නිවාස සංඛ්‍යාව | | | ✓ |

තිරසර සංවර්ධන ජාතික ඉලක්ක ජයගැනීම සඳහා ජාතික ධාරිතාවය ශක්තිමත් කරමින් ආපදා අවස්ථාවන්හිදී පීඩාවට පත්වන ජනතාව වෙත කෙටි කාලීනව හා දීර්ඝ කාලීනව සහන ලබාදීම හා එ සඳහා වූ ජාතික වැඩසටහන් දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් හා ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කිරීම ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් සිදු කරනු ලබයි.

## පරිච්ඡේදය 06

## 6. මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| අනු අංකය | තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 9 | 3 | 6 |
| 2 | තෘතියික මට්ටම | 1 | 0 | 1 |
| 3 | ද්විතියික මට්ටම | 600 | 571 | 29 |
| 4 | ප්‍රාථමික මට්ටම | 16 | 7 | 9 |
| | මුළු එකතුව | 626 | 581 | 45 |

### 6.2 ආයතනයේ කාර්සාධනය සඳහා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

01. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත අනුමත කොට ඇති

කාර්යමණ්ඩලය 626 කි. එම තනතුරු සඳහා මේ වන විට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟවීම ගැටලුවක්ව පවතී.

02. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 9 ක් පවැතියද ඉන් 6ක් පුරප්පාඩු ව ඇත. එහි අධ්‍යක්ෂ තනතුරු 01 ක් සහකාර අධ්‍යක්ෂ තනතුරු 4 ක්, ගණකාරධිකාරී තනතුරු 01 ඇතුළත් වේ. තෘතීය මට්ටමේ පරිපාලන නිලධාරී එක් තනතුරක් හා ද්විතීය මට්ටමේ සංවර්ධන නිලධාරී තනතුරු 26 ක්, රාජ්‍ය කළමානාකරණ සහකාර තනතුරු 03ක්, ව්‍යාපෘති නිලධාරී එක් තනතුරක් හා ප්‍රාථමික මට්ටමේ රියදුරු තනතුරු 05 ක්, කාර්යාල කාර්ය සහායක තනතුරු 03 ක් හා ලොරි රියදුරු සහායක තනතුරු 01ක් පුරප්පාඩුව පවතී.

03. අත්‍යාවශ්‍ය තනතුරු 45 ක් පුරප්පාඩුව පැවතීම ආයතනයේ කාර්යසාධනය හා ආපදා අවස්ථාවන්හිදී ජනතාවට සිදුවන පීඩාව අවම කිරීම සඳහා කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක වීම සඳහා දැඩිව බලපානු ලබයි.

## 07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ ගිණුම් අංශය මගින් සිදු කරයි | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ ගිණුම් අංශය මගින් සිදු කරයි | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ ගිණුම් අංශය මගින් සිදු කරයි | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ ගිණුම් අංශය මගින් සිදු කරයි | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ ගිණුම් අංශය මගින් සිදු කරයි | |
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ ගිණුම් අංශය මගින් සිදු කරයි | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ ගිණුම් අංශය මගින් සිදු කරයි | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ ගිණුම් අංශය මගින් සිදු කරයි | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ ගිණුම් අංශය මගින් සිදු කරයි | |

| | | | | |
|---|---|---|---|---|
| | ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ විගණන අංශය මගින් සිදු කරයි | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ ගිණුම් අංශය මගින් සිදු කරයි | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ ගිණුම් අංශය මගින් සිදු කරයි | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශ විගණන අංශය මගින් සිදු කරයි | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශය මගින් සිදු කරයි | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල නොවේ | අමාත්‍යාංශය මගින් සිදු කරයි | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශය මගින් සිදු කරයි | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල නොවේ | කල්බදු වාහන නොමැත | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල නොවේ** | අමාත්‍යාංශය මගින් සිදු කරයි | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | **අනුකූල නොවේ** | මේ පිළිබඳ තොරතුරු සන්නිවේදන නිලධාරියා දැනුවත් කර ඇත | ඒ සඳහා අවශ්‍ය පහසුකම් වෙබ් අඩවිය තුළ නිර්මාණය කරමින් පවතී |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | **අනුකූල වේ** | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | **අනුකූල වේ** | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | **අනුකූල නොවේ** | මානව සම්පත් සැලැස්ම සකස් කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කොට ඇත | ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කොට ඇත. |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | **අනුකූල නොවේ** | අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | **අනුකූල වේ** | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | **අනුකූල වේ** | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | **අනුකූල වේ** | | |